

7 ශ්‍රේණිය

සිංහල භාෂාව හා සාහිත්‍යය

24 පාඩම : පොල් ලද හැටි

11 කොටස




- A හා B ගැළපෙන සේ යා කරන්න.

| A | B |
|---|---|
| සාගිනි | පිපාසයෙන් |
| කරටිය | ශක්තිමත් |
| සැළි | ආයුධ ශිල්පය |
| පවසින් | ගහේ ඉහළ කොටස |
| අවිසිප් | බඩගිනි |
| සවිමත් | ලොකු මුට්ටිය |

- අපිත් රසවත් කතා ගොතමු.

**එහි දී පහත කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමුකළ යුතු ය.**

★ භාෂාවේ වචන රසවත් ලෙස යොදා ගත යුතුය.

★ කියවන්නාට රසයක් කුතුහලයක් ලබාදිය හැකි විය යුතුය.

★ අත්දැකීම් රසවත් ව ඉදිරිපත් කළ යුතු ය.

★ පොතපත කියවා නව දැනුම ලබාගත යුතු ය.

★ පරිසරය පිළිබඳ අවධානයෙන් සිට අත්දැකීම් ලබා ගත යුතු ය.

★ ඉගෙන ගත් සාම්ප්‍රදායික යෙදුම් ප්‍රබන්ධ නිර්මාණයට යොදාගත යුතු ය.

★ ප්‍රබන්ධය ලිවීමට පෙර කතා සැකිලි නිර්මාණය කළ යුතු ය.

★ ඉන් පසු කතා සැකිල්ලට අනුව ප්‍රබන්ධ ගොඩ නගන්න.

- පහත කතා සැකිල්ල ඇසුරින් ප්‍රබන්ධයක් ගොඩනගන්න.
- නිවස ඉදිරිපස කුඩා අඹ ගසකි.

- කුරුල්ලෙක් හා කිරිල්ලියක් අඹ ගස වෙත එයි.
- අලංකාර කූඩුවක් ඉදිවෙයි.
- නිවසේ සිටින කුඩා දරුවා එදෙස බලා සිටියි.
- ගැරඩියෙක් සෙමින් ගස දෙසට ඇදෙනු දකින ළමයා වහා එදෙසට දුවයි .
- ඔබත් මෙවන් කතා සැකිල්ලක් සකස් කර තවත් ප්‍රබන්ධයක් ගෙඩනගන්න.

(ප්‍රායෝගික අභ්‍යාස )

★ කුමාරතුංග මුනිදාස මහතා පිළිබඳ තොරතුරු ගොනුවක් සකසන්න.

★ ඔබ එකතුකළ තොරතුරු ඇසුරින් නිර්මාණාත්මක රචනයක් ලියන්න.

★ පාඩමේ දැක්වෙන අභ්‍යාසවල නිරත වන්න.